**ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය - 2021**

ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර එළඹුණු 2021 අප්‍රේල් 22 දිනැති ණය ගිවිසුම් අංක 6621-LK සහ 6619-LK හි විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව වාරිමාර්ග අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, උතුරු පළාත් සභාව, නැගෙනහිර පළාත් සභාව සහ ජල සම්පත් මණ්ඩලය මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු වනුයේ ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය ප්‍රතිසංස්කරණය කිරීම, ජල සම්පත් කළමනාකරණය සඳහා ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම සහ ජල සම්පත් යටිතල පහසුකම්වල ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමයි. ක්‍රියාකාරිත්වය යනු වේලිවල ආරක්ෂාකාරී බව වැඩිදියුණු කිරීම සහ වාරිකර්මාන්තය සඳහා ජලය බෙදාහැරීමේ ජාලය වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණය, වේලි ආරක්ෂාව ආශ්‍රිත යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම්, අවිනිශ්චිත හදිසි අවස්ථා ප්‍රතිචාර සහ ව්‍යාපෘති කළමනාකරණය යන අංග හතරක් යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම් අනුව, මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු මිලියන 14,199.43 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 75.03 ක් වූ අතර එයින් රු මිලියන 13,158.55 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 69.53 ක් මුල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2021 මැයි 13 දින ආරම්භ කරන ලද අතර 2025 ඔක්තෝබර් 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මතය

2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටස් තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල , ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.1 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 3.2 වගන්තිය | ව්‍යාපෘතිය සඳහා අනුමත මුළු පිරිවැය ඇස්තමේන්තුව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මෙම පිරිවැය ඇස්තමේන්තු ඉදිරියේදී විගණක වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත. | රේඛීය ආයතන සමඟ නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4 වන පරිච්ඡේදයේ 4.4 වගන්තියේ දක්වා ඇති නිර්ණායක සැලකිල්ලට නොගෙන RB ඇල වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා වන ඉංජිනේරු ඇස්තමේන්තුව කොටස්කරමින් තිබූ අතර, මෙසේ කොටස්කිරීම හේතුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියෙන් තොරව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත් වටිනාකම මත මත පදනම්ව ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය ගලා යාමට ඉඩහැරීමට කළමනාකාරීත්වය අවස්ථාව ලබාගෙන තිබිණි. කොන්ත්‍රාත්තු දෙකෙහිම සාමාන්‍ය ස්ථාවර අයිතම ද්විකරණය වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුවල වටිනාකම වැඩි වී ඇත. | අභ්‍යන්තර විගණනයට. මෙම පැකේජ දෙක සමාන්තරව ක්‍රියාත්මක වීමට අවශ්‍ය වූ අතර එබැවින් ලෝක බැංකුව ඒ පිළිබඳව “විරෝධතාවක් දක්වා නැත”. | උල්ලංඝනය කිරීම සඳහා පියවර ගත යුතු අතර මෙම කාරණයට එරෙහිව අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දිය යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය.

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ප්‍රසම්පාදන සැලැස්මට අනුව, 2021 වර්ෂයේදී පැකේජ 53ක් ආරම්භ කිරීමට නියමිතය. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදානය කර තිබුණේ පැකේජ 16ක් පමණි. ප්‍රසම්පාදන සැලැස්මෙන් සියයට 65කට වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ කිරීමට ව්‍යාපෘතිය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහවැලි අධිකාරිය මගින් පාලනය වන වලව ව්‍යාපෘතියේ RB ඇළ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොන්ත්‍රාත් පැකේජ දෙකක් ප්‍රදානය කෙරිණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු විසින් වැඩ සැලැස්මට අනුව ඉදිකිරීම් කටයුතු සිදු කර නොමැත. තවද, ඔවුන්ගේ වැඩ 2022 අප්‍රේල් 09 දින සිට නිසි දැනුම්දීමකින් තොරව අත්හිටුවා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් වැඩ නතර කිරීමේ අවදානමක් පවතින බව අදාළ ලියකියවිලිවලින් පෙන්නුම් කළද, රු. මිලියන 170 ක අත්තිකාරමක් සහ ගෙවීම් කොටසක් කොන්ත්‍රාත්කරුට වෙනත් අවශ්‍යතා සඳහා භාවිතා කිරීමට අවසර දී තිබේ. කෙසේ | කාර්ය සාධන ඇපකරයට අදාළ ගිවිසුමට අනුව කොන්ත්‍රාත්කරු ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වුවහොත් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ආර්ථික නොවන වටිනාකම අදාළ පාර්ශ්වයෙන් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙතත්, ගිවිසුමට අනුව අත්තිකාරම් ඇපකරය සහ කාර්ය සාධන ඇපකරය සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | | |
| (ආ) | වලව RB 41 km ප්‍රධාන ඇළ වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව වෙනත් කොන්ත්‍රාත්කරුවකු විසින් ලබා දෙන 2.5% වට්ටම් නොසලකා කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. තවද, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අඩුම ලංසුකරු සමඟ සාකච්ඡා නොකර දෙවන අඩුම ලංසුකරුවන් සමඟ සාකච්ඡා කර තිබේ. | අංක ගණිතමය නිවැරදි කිරීම් සහ M/S Finite Lanka (Pvt) Ltd විසින් වට්ටම් (2.5%) ලබා දුන් පසු, M/S Weerasooriya Builders හි නිවැරදි කරන ලද ලංසු මිල රුපියල් මිලියන 525 ක් වන අතර එය M/S Finite Lanka (Pvt) Ltd හි නිවැරදි කළ මිල වන රු. මිලියන 528ට වඩා අඩුය. | ලංසු ඇගැයීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය සහ අනුකූලතාව සහතික කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | ඉදිකිරීම් කළමනාකරණ සේවාවේ තොරතුරු BOQ හි අවසන්කර නොමැතිවීම හෝ සාකච්ඡා අදියරේදී පවතින බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම අයිතමගත සාකච්ඡා වටිනාකම යටතේ සපයනු ලබන සේවාවන් සීමා කිරීමට කොන්ත්‍රාත්කරුට අවස්ථාව ලැබුණි.එබැවින්, ඉහත සාකච්ඡාව ඇගැයීමට බලපෑමක් ඇතිකර නොමැති අතර, එය ඇගැයීමේ සහ තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටියේ විනිවිදභාවය සහ අනුකූලතාව සහතික කිරීම කෙරෙහි දැඩි ලෙස බලපෑවේය. | ලංසු ලේඛනවලට අනුව ව්‍යාපෘතිය සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සහිතව අවශ්‍ය තනතුරු සංඛ්‍යාව සමඟ අවශ්‍ය ප්‍රධාන පුද්ගලයින්ගේ ලැයිස්තුව ඉල්ලා තිබේ. | ලංසු ඇගැයීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය සහ අනුකූලතාව සහතික කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන කොන්ත්‍රාත් 2021 නොවැම්බර් 20 දින ප්‍රදානය කර තිබුණද, පිළිගැනීමේ ලිපියට අත්සන් කිරීම කොන්ත්‍රාත්කරු විසින් ප්‍රතික්ෂේප කර තිබේ. කෙසේ වෙතත්, ලංසු බැඳුම්කරය කල් ඉකුත් වන තුරු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඒ අනුව නීතිමය පියවර ගෙන නොතිබුණි. | පරිසර හා ආරක්ෂණ ඒකකය විසින් 2022 අප්‍රේල් මාසයේදී එම ස්ථානයට ගොස් එම ස්ථානයේ මෙම තත්ත්වයන් නිරීක්ෂණය කරන ලදී. අපේක්ෂිත අවදානම් තත්ත්ව අවම කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කණ්ඩායම විසින් කොන්ත්‍රාත්කරුට උපදෙස් දෙන ලදී. | ආර්ථික නොවන වටිනාකම අදාළ පාර්ශ්වයෙන් අයකරගත යුතුය. |

## 3.3 ස්ථානය නැරඹීමේදී කරන ලද නිරීක්ෂණ

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉන්ජිනේරුවරයා විසින් රු. මිලියන 22.4 කට වලව RB කිලෝමීටර් 41 ප්‍රධාන ඇළ වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තු 02 ක් සඳහා IPC අංක 01 අනුමත කර තිබිණි. ඉදිකිරීම් කටයුතු අත්හිටුවීම හේතුවෙන් බොහෝ ඉදිකිරීම් අපතේයන බවට පත්ව තිබෙන බවත්, වැඩබිමේ ආරක්ෂාව සඳහා සහ පාරිසරික බලපෑම අවම කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් කටයුතු කර නොමැති බවත් භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. ඇළ බැම්ම පාරේ ගමන් ගන්නා ජනතාව එයින් දැඩි ලෙස පීඩාවට පත් වූහ. | පරිසර හා ආරක්ෂණ ඒකකය විසින් 2022 අප්‍රේල් මාසයේදී එම ස්ථානයට ගොස් එම ස්ථානයේ මෙම තත්ත්වයන් නිරීක්ෂණය කරන ලදී. අපේක්ෂිත අවදානම් තත්ත්ව අවම කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කණ්ඩායම විසින් කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබා දෙන ලදී. | ස්ථානය ආරක්‍ෂා කිරීමටත් පාරිසරික බලපෑම අවම කිරීමටත් ක්‍රියා කළ යුතු අතර ආර්ථිකමය නොවන වටිනාකම අදාළ පාර්ශ්වයෙන් අයකරගත යුතුය. |
| (ආ) | එම ස්ථානයේ ඇති ද්‍රව්‍ය සඳහා IPC අංක 01 යටතේ පිළිවෙලින් රුපියල් මිලියන 2.8 ක මුදලක් සහ රුපියල් මිලියන 3ක් ගෙවා ඇති අතර සියලුම ද්‍රව්‍ය ඇළ බැම්ම මාර්ගයේ අවිධිමත් ලෙස ගබඩා කර තිබෙන අතර බොහෝ සුන්බුන් ගුණාත්මක භාවයෙන් අපේක්ෂිත තත්ත්වයට වඩා දුර්වලය. | ද්‍රව්‍යවල ගුණාත්මකභාවය නැවත තහවුරු කරන ලෙස ඉංජිනේරුවරයාට දන්වා ඊළඟ IPC හි දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ස්ථානය ආරක්‍ෂා කිරීමටත් පාරිසරික බලපෑම අවම කිරීමටත් ක්‍රියා කළ යුතු අතර ආර්ථික නොවන වටිනාකම අදාළ පාර්ශ්වයෙන් අයකරගත යුතුය. |